ප්‍රධාන ලේකම් කාර්යාලය
සබරගමුව පළාත
பிரதான செயலாளர் அலுவலகம்
சபரகமுவ மாகாணம்
**Office of the Chief Secretary**
**Sabaragamuwa Province**

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary } 045 - 2231703
කාර්යාලය / அலுவலகம் / Office } 045 - 2222143, 045 - 2222144, 045 - 2223080, 045 - 2232263
ෆැක්ස් / தொலைநகல் / Fax } 045 - 2222793
විද්‍යුත් තැපෑල / மின்அஞ்சல் / E-mail } chiefsecretary@sg.gov.lk

පළාත් සභා සංකීර්ණය, නව නගරය, රත්නපුර. மாகாண சபைக் கட்டிடத் தொகுதி, புதிய நகரம்-இரத்தினபுரி Provincial Council Complex, New Town, Ratnapura.


මගේ අංකය / எனது இல. / My Ref. } සීඑස්.03/06/01/01චක්‍ර.ලේඛ
ඔබේ අංකය / உமது இல. / Your Ref. } ........................................
දිනය / திகதி / Date } 2024.07.04

ප්‍රධාන ලේකම් චක්‍රලේඛ අංක 04/2024

සබරගමුව පළාත් සභාවේ සියළුම ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
ආයතන ප්‍රධානීන් වෙත.

**<u>පළාත් සභා ශ්‍රවණාගාරය වැඩසටහන් සඳහා ලබාදීමේදී අයකරන ගාස්තු හා සංකීර්ණය තුළ භාණ්ඩ අලෙවි කිරීම සඳහා අය කරනු ලබන ගාස්තු සංශෝධනය කිරීම.</u>**

පළාත් සභා ශ්‍රවණාගාරය විවිධ කටයුතු සඳහා ලබාදීමේදී විදුලිය, සනීපාරක්ෂක පහසුකම් හා අනෙකුත් සේවා වෙනුවෙන් විශාල වැයබරක් පළාත් සභාවට දැරීමට සිදුව ඇත. ඒ අනුව මෙම ශ්‍රවණාගාරයේ නඩත්තු විධිමත්ව පවත්වා ගැනීම සඳහා ක්‍රමවේදයක අවශ්‍යතාවය දැඩිව උද්ගතව තිබියදී එය සැලකිල්ලට ගෙන 2013.10.23 වන දින අංක 03/2013 හා 2016.06.02 වන දින අංක 03/2013-i දරණ ප්‍රධාන ලේකම් චක්‍ර ලේඛ දෙකක් නිකුත් කර ඇත.

02. එහෙත් වර්තමානය වන විට චක්‍රලේඛය මගින් දැනුම් දී ඇති ගාස්තු ශ්‍රවණාගාරයේ නඩත්තු කටයුතු සඳහා ප්‍රමාණවත් නොවීම මත පහත සඳහන් පරිදි නැවත ගාස්තු සංශෝධනය කිරීමට හා පළාත් සභා සංකීර්ණය තුළ භාණ්ඩ අලෙවි කිරීම වෙනුවෙන් පහත පරිදි ගාස්තු අයකිරීමට සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත.

03. ඒ අනුව 2013.10.23 වන දිනැතිව නිකුත් කරන ලද ප්‍රධාන ලේකම් චක්‍ර ලේඛ අංක 03/2013 හා 2016.06.02 වන දිනැතිව නිකුත් කරන ලද ප්‍රධාන ලේකම් චක්‍ර ලේඛ අංක 03/2013-i මෙයින් අවලංගු කරනු ලැබේ.

අය කරනු ලබන නව ගාස්තු

**01.** ශ්‍රවණාගාර පහසුකම් ලබා දීම (වායු සමීකරණ පහසුකම් රහිත)

| ආයතනය | මුල් පැය 04 සඳහා | වැඩිවන පැයකට | වේදිකාව භාවිතා කරන්නේ නම් |
|---|---|---|---|
| පළාත් සභාවට අයත් විෂය පථයට ගැනෙන රැස්වීම් / වැඩමුළු සඳහා නොමිලේ ලබාදීම. | | | |
| පළාත් සභාවේ නොවන වෙනත් රාජ්‍ය ආයතන | රු. 18,000.00 | රු. 3,000.00 | රු. 5000.00 |
| පුද්ගලික ආයතන | රු. 18,000.00 | රු. 3,000.00 | රු. 8000.00 |

**02.** ශ්‍රවණාගාරයේ වායු සමීකරණ පහසුකම් ලබා ගැනීම.

| ආයතනය | කාල සීමාව | මුල් පැය සඳහා | වැඩිවන පැයකට |
|---|---|---|---|
| පළාත් සභාවේ නොවන වෙනත් රාජ්‍ය ආයතන හා පුද්ගලික ආයතන | පෙ.ව. 6.30 සිට ප.ව. 6.30 | රු. 10,560.00 | රු. 5,280.00 |
| | ප.ව. 6.30 සිට රාත්‍රී 10.30 දක්වා කාලය තුළ | රු. 12,360.00 | රු. 6,180.00 |
| පළාත් සභාවට අයත් විෂය පථයට ගැනෙන රැස්වීම් / වැඩමුළු සඳහා ඉහත මුදලින් අඩක් අයකිරීම. | | | |

**03. ශ්‍රවණාගාරයේ ඇති ශබ්ද විකාශන යන්ත්‍රය ලබාදීම.**

| ආයතනය | මුල් පැය 04 සඳහා | වැඩිවන පැයකට |
|---|---|---|
| පළාත් සභාවට අයත් ආයතන | රු. 3,000.00 | රු. 500.00 |
| පළාත් සභාවට අයත් නොවන වෙනත් රාජ්‍ය ආයතන | රු. 10,000.00 | රු. 1,500.00 |
| පුද්ගලික ආයතන | රු. 12,000.00 | රු. 1,500.00 |

**04. පොදු කොන්දේසි**

| පොදු කොන්දේසි | ගෙවිය යුතු මුදල |
|---|---|
| ආපසු ගෙවන ඇප තැන්පතුව සබරගමුව පළාත් සභාවට අයත් ආයතන වලින් අය නොකිරීමට හා පළාත් සභාව යටතට නොගැනෙන පිටත ආයතන සඳහා | රු. 20,000.00 |
| අයකිරීම් මත ශ්‍රවණාගාරය වෙන් කරන වැඩ සටහන් අවස්ථා වල සේවයේ යොදවන පවිත්‍රතා සේවකයකු සඳහා (උපරිම 03 දෙනෙකු සඳහා ) එක් අයෙකුට දීමනාව. | රු. 750.00 |
| සභාවේ නොවන වෙනත් රාජ්‍ය ආයතන හා පුද්ගලික ආයතන විසින් සති අන්ත දින (සෙනසුරාදා සහ ඉරිදා ) හා රජයේ නිවාඩු දින පවත්වනු ලබන වැඩසටහන් සඳහා ශ්‍රවණාගාරය භාරව සිටින නඩත්තු අංශයේ නිලධාරීයා සඳහා දිනකට දීමනාව | රු. 1,000.00 |

**05. පළාත් සභ සංකීර්ණය තුළ භාණ්ඩ අලෙවි කිරීම.**

| පොදු කොන්දේසි | ගෙවිය යුතු මුදල |
|---|---|
| විදුලි උපකරණ , ගෘහාශ්‍රිත උපකරණ හා දැව ආශ්‍රිත නිෂ්පාදන (ආයතනගත/ සමූහ ව්‍යාපාර) සඳහා දිනකට | රු. 6,000.00 |
| ව්‍යාපාරික කටයුතු සඳහා පළාත් සභා පරිශ්‍රය ඇතුලත නවතා තබන වාහන සඳහා දිනකට | රු. 500.00 |
| කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිෂ්පාදන හැර අනෙකුත් නිමි ඇඳුම් අලෙවිය සඳහා දිනකට | රු. 500.00 |
| සමූහ ව්‍යාපාර සහ ආයතන ගණයට අයත් නොවන පරිගණක උපාංග හා දුරකථන උපාංග අලෙවි කටයුතු සඳහා දිනකට | රු. 500.00 |
| කුඩා පරිමාන ව්‍යාපාර කටයුතු (ධාන්‍ය වර්ග, කුළුබඩු, බැකරි කළ ආහාර වර්ග, පොත්, ආභරණ විසිතුරු භාණ්ඩ ආදිය) දිනකට | රු. 250.00 |
| පළා වර්ග, හඳුන්කූරු, පහන්තිර වැනි ස්වයං රැකියා ලෙස කෙරෙන සුළු වෙළඳ කටයුතු සඳහා මුදල් අය නොකර ලබාදීම. | |

06. පළාත් සභා ශ්‍රවණාගරය වෙන්කර ගැනීමට හා පළාත් සහ සංකීර්ණය තුළ භාණ්ඩ අලෙවි කිරීමට ඉල්ලුම් කිරීමේදී ඉහත කරුණු සැලකිල්ලට ගෙන අදාළ විස්තර සඳහන් කර එම ඉල්ලීම් මා වෙත යොමු කළ යුතු බව කාරුණිකව දන්වමි.

මහින්ද එස්.වීරසූරිය
ප්‍රධාන ලේකම්,
සබරගමුව පළාත

මහින්ද එස්. වීරසූරිය
ප්‍රධාන ලේකම්
සබරගමුව පළාත